සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
நலன்புரி நன்மைகள் சபை
WELFARE BENEFITS BOARD
මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
Ministry of Finance, Economic Stabilaization & National Policies
මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. | MF/WBB/02/Notice/D/Div.s./2022 | ඔබේ අංකය / உமது இல / Your No | | දිනය / திகதி / Date | 2023.06. 23 |

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් මගින්,

අභියාචනා කමිටු සභාපතිවරුන් වෙත

## අභියාචනා කමිටු සඳහා උපදෙස්

සුබසාධක ප්‍රතිලාභ පනතේ 11 වගන්තිය යටතේ ප්‍රසිද්ධ කරන ලද තේරීම් ලැයිස්තුවට අදාළව ඉදිරිපත් කරනු ලබන අභියාචනා හා විරෝධතා සම්බන්ධයෙන් ක්‍රියාකළයුතු කාර්යපටිපාටිය සම්බන්ධයෙන් මෙම උපදෙස් නිකුත් කෙරේ.

**අභියාචනා කමිටු සංයුතිය**


ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට එක් අභියාචනා කමිටුවක් බැගින් පිහිටවිය යුතුයි. අභියාචනා කමිටුවක් පස් දෙනකුගෙන් සමන්විත විය යුතුයි. යම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට අදාළ අභියාචනා කමිටුවක සභාපතිවරයා ලෙස එම කොට්ඨාශයේ නොවන දිස්ත්‍රික්කයේ වෙනත් කොට්ඨාශයක ප්‍රාදේශීය ලේකම්වරයෙකු දිස්ත්‍රික් ලේකම් විසින් නම් කළ යුතුයි. දිස්ත්‍රික් ලේකම් විසින් දිස්ත්‍රික් ලේකම් ගේ පරිපාලනය යටතේ ක්‍රියාකරන තවත් නිලධාරීන් දෙදෙනෙකුද නම් කළයුතුයි. අනෙක් සාමාජිකයින් දෙදෙනා අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල සුබසාධක ප්‍රතිලාභ ක්ෂේත්‍රයට අදාළව සක්‍රියව නිරතවන රාජ්‍ය නොවන සංවිධාන නියෝජනය කරමින් නම් කළ යුතුය. තේරීම් කමිටුව නියෝජනය කළ තැනැත්තෙකු අභියාචනා කමිටුවට නම් නොකිරීමට වගබලා ගත යුතුයි.ප්‍රතිලාභීන් වැඩි සංඛ්‍යාවක් සිටින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සඳහා අභියාචනා කමිටු කිහිපයක් වුවද පිහිටුවීමට දිස්ත්‍රික් ලේකම්වරුන්ට පියවර ගත හැකියි.

**අභියාචනා හා විරෝධතා පරීක්ෂා කිරීම**

ඉදිරිපත්වන අභියාචනා හා විරෝධතා පරීක්ෂා කර ඒ පිළිබඳ තීරණ ලබාදීමේ වගකීම කමිටු සභාපතිවරයා ප්‍රමුඛ අභියාචනා කමිටුවට පැවරී ඇත.

මේ සඳහා කමිටු සභාපතිවරයා IWMS පරිගනක පද්ධතියට පිවිස අභියාචනා / විරෝධතා මොඩියුලය තෝරා ගත යුතුයි.

එවිට එම කමිටුවට අදාළ වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉදිරිපත්ව ඇති අභියාචනා හා විරෝධතා පරිගනක පද්ධතිය තුල දිස්වේ.




කමිටු සභාපතිවරයාට පුද්ගලයින් විසින් ඉදිරිපත් කර ඇති අභියාචනා හා විරෝධතා දැක බලාගැනීමට හැකියාව ඇත. ඊට අතිරේකව තේරීම් කමිටුව විසින් දක්වා ඇති අදහස් සහ සංගණන දත්ත ද දැක බලාගැනීමට හැකිය. මෙම තොරතුරු පදනම් කරගෙන අභියාචනා හා විරෝධතා සම්බන්ධයෙන් ප්‍රතික්ෂේප කිරීමේ තීරණය හෝ පරීක්ෂණයක් ආරම්භ කිරීම හෝ නැවත සංගණනයක් සඳහා යොමු කිරීම හෝ සිදු කළ හැක.

**අභියාචනා හා විරෝධතා ප්‍රතික්ෂේප කිරීම**

කමිටුව විසින් ප්‍රතික්ෂේප කිරීමට තීරණය කරන ලද අභියාචනා හෝ විරෝධතා සම්බන්ධයෙන් ඒ බව ප්‍රතික්ෂේප කිරීමට හේතුවද සමඟ කමිටු සභාපතිවරයා විසින් පරිගනක පද්ධතිය යාවත්කාලීන කර අභියාචනය/ විරෝධතාවය අවසන් කළ යුතුය. පරිගනක පද්ධතිය විසින් ප්‍රතික්ෂේප කිරීම දැනුම් දෙමින් පනිවිඩයක් නිකුත් කරනු ඇත.

**අභියාචනා හා විරෝධතා පරීක්ෂණ සඳහා කැඳවීම**

අභියාචනා කමිටුව වෙනුවෙන් සභාපතිවරයා විසින් අභියාචනායට හෝ විරෝධතාවයට ලක් වූ මූලික සුදුසුකම්ලාභියාව අදාළවන ලියකියවිලි ද සමඟ පරීක්ෂණයක් සඳහා කමිටුව හමුවට කැඳවිය හැක. ඒ අනුව පරිගනක පද්ධතිය තුළින් මූලික සුදුසුකම්ලාභියා වෙත කැඳවීමේ කෙටි පනිවිඩයක් යැවිය හැක.

**නැවත සංගණනයක් සඳහා යොමු කිරීම**

කමිටුව වෙනුවෙන් කමිටු සභාපතිවරයා විසින් යම් අභියාචනයකට හෝ විරෝධතාවයකට අදාළ අයදුම්පතක් නැවත සංගණනය සඳහා යොමු කළහැක. ඒ අනුව සභාපතිවරයා විසින් සංගණන නිලධාරියකු හඳුනාගෙන පරිගනක පද්ධතිය තුළ යාවත්කාලීන කළ යුතුයි. මූලික සංගණනයට සහභාගි වූ නිලධාරියාම නැවත සංගණනය සඳහා යෙදවීම සිදු නොකල යුතුයි.

**අභියාචනා හා විරෝධතා යථාවත් කිරීම**

අභියාචනා කමිටුව විසින් සිදුකරන ලබන පරීක්ෂණ මඟින් අනාවරණය වනු ලබන සාක්ෂි මත මූලික දත්ත සංශෝධනය කිරීමට අවශ්‍ය බව පෙනීයන්නේ නම් සභාපතිවරයා විසින් එම දත්ත යාවත්කාලීන කළ යුතුය.

එසේ දත්ත යාවත්කාලීන කර සැපයූ විට අභියාචනය/ විරෝධතාවය අවසන් වේ. තවද අභියාචනාකරු/ විරෝධතාකරු වෙත ඒබව දැනුම් දිය යුතුය.

**නැවත සංගණනය කළ දත්ත භාර ගැනීම**

නියම කරන ලද සංගණන නිළධාරියකු විසින් දත්ත නැවත සංගණනය කර අවසන් වූ විගස අභියාචනා කමිටුව විසින් එම නැවත සංගණනය කළ දත්ත පරීක්ෂාවට ලක් කර පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම කළ හැක.

නැවත සංගණනය කළ දත්ත පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම සිදුකළ විට අභියාචනය හෝ විරෝධතාවය අවසන් වූ ලෙස සැලකේ. තවද අභියාචනාකරුට/ විරෝධතාකරුට දැනුම් දෙනු ලැබේ.

සුදුසුකම්ලාභීන් තෝරා ගැනීම උපමාන 6ක් යටතේ නිර්නායක 22 ක් පදනම් කර ගෙන ලකුණු ලබාදීම තුලින් සිදුකර ඇත. එබැවින් එම ඕනෑම නිර්නායකයකට අදාළව සපයා ඇති තොරතුරුවල සංශෝධනයන් අභියාචනා මණ්ඩලයේ තීරණය අනුව සිදු කළ හැකිය. කෙසේවෙතත් අභියාචනාකරු ප්‍රතිලාභ ලැබීම සඳහා සුදුස්සකු/ නුසුදුස්සෙකු වන්නේ නිර්නායක 22 යටතේ සැපයෙන දත්ත වල සමස්ත බලපෑම මතය

බී. විජයරත්න
සභාපති / කොමසාරිස්

කාර්යාලය
அலுவலகம்
Office
Tel: 009411-2151481
009411-2484600/4117
Fax: 009411-2151482
විද්‍යුත් තැපැල
மின்னஞ்சல்
e-mail
welfarebenefitboard2016@gmail.com
info@iwms.wbb.gov.lk
වෙබ් අඩවිය
இணையதளம்
Website
www.wbb.gov.lk